(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 100.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 සැප්තැම්බර් මස 20 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ලාල් ග්‍රේරු මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවි නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **බුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **දිළුම් අමුණුගම මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු  සුජිත් සංජය පෙරේරා මහතා

ගරු  ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු  අශෝක ප්‍රියන්ත මහතා

ගරු  හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු  එස්. ප්‍රේමරත්න මහතා

ගරු  බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු  තාරක බාලසූරිය මහතා

ගරු  විජිත බේරුගොඩ මහතා

ගරු  මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  කේ. කාදර් මස්තාන් මහතා

ගරු  ඉම්රාන් මහරූෆ් මහතා

ගරු  අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු  අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු  තිලක් මාරපන මහතා

ගරු  (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු  එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු  බිමල් රත්නායක මහතා

ගරු  ලොහාන් රත්වත්තේ මහතා

ගරු  ප්‍රසන්න රණතුංග මහතා

ගරු  ප්‍රසන්න රණවීර මහතා

ගරු  කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු  ඉෂාක් රහුමාන් මහතා

ගරු  මුජිබුර් රහුමාන් මහතා

ගරු  හර්ෂණ රාජකරුණා මහතා

ගරු  නාමල් රාජපක්ෂ මහතා

ගරු  අංගජන් රාමනාදන් මහතා

ගරු  ගාමිණී ලොකුගේ මහතා

ගරු  ජානක වක්කුඹුර මහතා

ගරු  විදුර වික්‍රමනායක මහතා

ගරු  (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු  ඒ. ඒ. විජේතුංග මහතා

ගරු  (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු  ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු එස්. වියාළේන්දිරන් මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු ඊ. සරවනපවන් මහතා**

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

නීල් ඉද්දවල මහතා, වැඩබලන පාර්ලිමේන්තුවේ මහ ලේකම් සහ කාර්ය මණ්ඩල ප්‍රධානී

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදනය කරන ලදී :—

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව **'ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන)'** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) කථානායකතුමා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ I කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයිද මුද්‍රණය කළ යුතු යැයිද නියෝග කරන ලදී.

(2) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින් 2015 වර්ෂය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්—

(i) 2014 වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2013 සහ 2014 වර්ෂ සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තා පිළිගන්වා,

එම වාර්තා තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන හා ගිණුම් වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වගන්තියේ (2) උප වගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වගන්තිය යටතේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2016 ජූනි මස 15 දිනැති අංක 1971/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය පිළිගන්වා, එම නියෝගය බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු විජිත හේරත් මහතා විසින්, කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද 'ඉඩම් අත්කරගැනීමේ පනත (460 වන අධිකාරය) යටතේ නියෝග', '2014 මුදල් වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජෙනරාල්ගේ කාර්ය සාධන වාර්තාව' සහ '2015 මුදල් වර්ෂය සඳහා වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව' යන කරුණු සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද 'විසර්ජන (සංශෝධන)' සහ 'වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත්, '1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග', '1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය' සහ 'ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ 2016 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳ යෝජනාව' යන කාරණා සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම් :**

(1) වාරියපොල, සියඹලාකැලේ යන ලිපිනයෙහි පදිංචි ආර්. එම්. පොඩි බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2016.08.05 දිනැති පෙත්සම ගරු එස්. බී. නාවින්න මහතා විසින් පිළිගන්වන ලදී.

(2) නෙළුම්දෙණිය, කොණ්ඩගල, "සෙන්ට්‍රල් සප්ලයිස්" යන ලිපිනයෙහි පදිංචි ජේ. එම්. සුමනාවතී මහත්මියගෙන් ලැබුණු 2016.04.01 දිනැති පෙත්සම ගරු ටී. බී. ඒකනායක මහතා විසින් පිළිගන්වන ලදී.

(3) දොම්පේ, වේල්ගම යන ලිපිනයෙහි පදිංචි පී. එම්. පොඩි අප්පුහාමි මහතාගෙන් ලැබුණු 2015.10.02 දිනැති පෙත්සම ගරු රුවන් විජයවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) බත්තරමුල්ල, නාගාමුල්ල පාර, අංක 1013 ඊ/1 දරන ස්ථානයෙහි පදිංචි කේ. යූ. ආර්. පෙරේරා මහතාගෙන් ලැබුණු 2016.05.11 දිනැති පෙත්සම; සහ

(ii) කොළඹ 07, මරීනා ඇවනියු, අංක 03 දරන ස්ථානයෙහි පදිංචි වෛද්‍ය එස්. එච්. කේ. සමරවීර මහතාගෙන් ලැබුණු 2016.06.25 දිනැති පෙත්සම

ගරු සුජීව සේනසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) සේරුනුවර, ආර්.බී. 02, අංක 158/1 දරන ස්ථානයෙහි පදිංචි එච්. ඩී. ශ්‍රියානි චන්ද්‍රකාන්ති මහත්මියගෙන් ලැබුණු 2016.08.18 දිනැති පෙත්සම;

(ii) මොරවැව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන කේ. ජී. දයානන්ද මහතාගෙන් ලැබුණු 2016.08.15 දිනැති පෙත්සම; සහ

(iii) බලංගොඩ, වැලිගෙපොල, හපුගස්තැන්න යන ලිපිනයෙහි පදිංචි යූ. එම්. යූ. ජී. හසිතා උඩුගම මෙනවියගෙන් ලැබුණු 2016.07.13 දිනැති පෙත්සම

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) මහලාගම, කැකුණගොල්ල යන ලිපිනයෙහි පදිංචි එච්. එම්. උපාලි සමරවීර මහතාගෙන් ලැබුණු 2016.07.18 දිනැති පෙත්සම; සහ

(ii) කුරුණෑගල, ජයන්තිපුර, අංක 107/15 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. විජේවර්ධන මහතාගෙන් ලැබුණු 2016.07.24 දිනැති පෙත්සම

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා විසින් පිළිගන්වන ලදී.

(7) මොරටුව, වොට්සන් පීරිස් මාවත, අංක 7/2 දරන ස්ථානයෙහි පදිංචි ජේ. පී. සරත් චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු 2016.07.07 දිනැති පෙත්සම ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(8) කොළඹ - 04, දුම්රියපල පාර, ඕෂන් වීව් ටවර්, අංක 13 ඒ දරන ස්ථානයෙහි පදිංචි නිල්මිණි දූෂාන්ති පින්ටෝ (එෆ්. නාඩියා) මහත්මියගෙන් ලැබුණු 2016.07.23 දිනැති පෙත්සම ගරු ටී. රංජිත් ද සොයිසා මහතා විසින් පිළිගන්වන ලදී.

(9) මුලතිව්, මුල්ලියවලෙයි, මාමූලෙයි යන ලිපිනයෙහි පදිංචි මනෝහරන් සාන්තනායකි මහත්මියගෙන් ලැබුණු 2016.07.01 දිනැති පෙත්සම ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව :** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය තත්ත්වය පවත්වාගෙන යාම සහ මෙහෙයවීම සඳහා වගකිවයුතු ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පිහිටුවීම සඳහා ද; ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2016 ඔක්තෝබර් මස 04 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයිද නියෝග කරන ලදී.

**6. පරිපූරක මුදල — ශීර්ෂය 147 — වැඩසටහන 1 :** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2016 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන හා 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් දැනටමත් අනුමත කර ඇති වියදම් සීමා නොඉක්මවන පරිදි එහි විවිධ වැය ශීර්ෂ යටතේ අපේක්ෂිත ඉතිරිවීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂයේ "අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතියට" මාරුකර ගැනීමටත් 2015 අංක 16 දරන විසර්ජන පනතේ 6.1 හා 6.2 වගන්ති මඟින් සලසා ඇති විධිවිධානවලට යටත්ව හඳුනාගත් විදේශ මූල්‍යකරණ සහිතව ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙමින් පරිපූරක ප්‍රතිපාදන ලෙස අදාළ අමාත්‍යාංශවලට මාරු කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයට අයත් අනෙකුත් ඕනෑම අරමුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් මූල්‍යකරණය කරන ලද රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් (රු. 592,925,000) නොඉක්මවන මුදලක් උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සලසා ගත යුතු ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ශීර්ෂය | 147 | - ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය |
| වැඩ සටහන | 1 | - මෙහෙයුම් වැඩසටහන |
| පුනරාවර්තන වියදම් | | - රු. 469,425,000 |
| මූලධන වියදම් | | - රු. 123,500,000 |

මුළු වියදම = **රු. 592,925,000**

(රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් පමණි.)

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම**

| | |
|---|---|
| උපරිම වියදම් සීමාව | - රු. 2,000,000 |
| අවම ලැබීම් සීමාව | - රු. 150,000 |
| උපරිම හර ශේෂ සීමාව | - රු. 3,500,000 |

[2016 අගෝස්තු මස 09 වැනි දින ඉදිරිපත් කරන ලද 2016 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව]

(අ. භා. 3.17 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.05 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 6.14 ට කථානායකතුමා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය :** මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මැයි 26 දිනැති අංක 1968/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම (කම්කරු නිළධාරීන්ගේ සේවා ව්‍යවස්ථා පිළිබඳ ගැටලු) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 6.23 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 7.23 ට, 2016 සැප්තැම්බර් මස 21 වැනි බදාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.